# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1828/16 – 2013 සැප්තැම්බර් 18 වැනි බදාදා – 2013.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 278 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/4/2012/ඩී/352.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: VSW/DS/LB/ACQ/MUL/ARMY.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 අගෝස්තු මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, වලිකාමම් නිරිත.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුල්ලනයි, ජේ/156, මුල්ලනයි ගමේ, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක වයිජ්/එස්එන්ඩී/2013/60 හා 2013.04.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.2410 ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සිරුවිලාන – ප්‍රමාණය: හෙක්. 0.2410 පමණ**
උතුරට: ජයදේවන් සිවශක්ති හිමිකම් කියන ඉඩම සහ සේකර ජයසිංහම් රාජේස්වරී හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: පාර; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: පාර සහ ජයදේවන් සිවශක්ති හිමිකම් කියන ඉඩම.

10 – 80